සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අගෝස්තු මාසය - 4 සතිය පුනරීක්ෂණ අංක 4

1)මෙම වාක්‍ය සත්‍ය ද අසත්‍ය ද යන්න වරහන් තුළ සටහන් කරන්න

1.නාම පදයකට ඉදිරියෙන් යොදන 'නො' නිපාතය ඇත් කර ලියනු ලැබේ. ( ........... )

2.නී යනු ජලයට පර්යාය පදයකි. ( ........... ) 3.විරාම ලක්ෂණ යෙදෙන්නේ කථන භාෂාවේ දී ය. ( ........... )

4.රන් තැටියක කඳුළු කාව්‍ය සංග්‍රහය එස්. මහින්ද හිමියන්ගේ ය. ( ........... )

5.නැණ නැවින් සත් සයුර තරණය කරන කවියනි, මගේ දැය සතු ...මෙහි නැණ නැවින් යනු උපමාවකි. ( ........... ) ( 2×5 )

2) වන විල් වැදෑ බොල් සෙවලැ'ඟැ තවරා

ගන වල් කැල ඇර ගෙන අති නදුරා

.................................................................... .............

පිළිමල් වන මීවුන් දකු නුදුරා

1.කවියෙහි හිස් තැන පුරවන්න 2. මෙහි එන සත්ත්ව කොට්ඨාසය නම් කරන්න3. සත්ත්වයිගේ ප්‍රඩණ්ඩත්වය විස්තර කරන්න

4.මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද? 5.මෙම වචනවල අරුත් ලියන්න. *පිළිමල් *සිඟු *දකු ( 2×5 )

3) මෙම වචනවල අරුත් ලියන්න

1. එකුරුත්තේ 2. මහමෙර 3. මනඃකල්පිත 4. ඉදුවර 5.ප්‍රදානය ( 2×5 )

4) ගස වතුසුදු

වී පිරිසිදු

පොහොය නැතිදු

සිල් ගත් බදු *මෙම පද්‍යයේ අදහස එක් වාක්‍යයකින් ලියන්න ( 5 )

5)පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවන්න

1.මම බොදු දරුවෙක් වෙමි. 2.නුඹලා ඉවසීමෙන් කටයුතු කරහු. 3. සඳ බබළයි.

4.සමනල්ලු මල් පැණි බොති. 5. අපි යහපතෙහි හැසිරෙමු. ( 3×5 )

6)ධීවර භාෂාවේ යෙදෙන මෙම වචන පොදු ව්‍යවහාරය හා සසඳන්න

1. ඉයත්තුව ජාලය
2. හරාව අහස ගෙරවීම
3.හයිය මුහුදු රළ
4.මාරියාව කාලගුණය
5.දැල සුබ කාලය ( 1×5 )

7) නාම විශේෂණ පද යොදා මෙම වාක්‍ය නැවත ලියන්න

1.රෝස මල සුන්දරයි 2. කුරුල්ලා අඹ කයි

3. කොළ මිදුලෙහි වැටී ඇත.

4. දරුවා දුවපැන ඇවිදියි

5.වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කරයි. ( 1×5 )

8)නිවසේ සිට කියවීමට අවශ්‍ය පොත් කිහිපයක් ගෙන්වා ගැනීමට ඔබේ නිවසට ආසන්න වෙළඳ ආයතනයකට යවන ලිපිය සකසන්න ( 20 )

9) රචනය - මහ සමුදුර මැද ගත කළ රැයක් ( 20 )